සත්ත්ව ලෝකය

# කුරුල්ලනේ ආයුබොවන් !



5



2

## "සංචාරක කුරුලු විශේෂයන් ගේ ගහණය සීඝ්‍රයෙන් පහත වැටෙමින් පවතී." වරද කොතැන ද? පෘථිවි ගෝලය උණුසුම් වීම මෙහිලා වගකිව යුතු ද?

ශීත සෘතුව නිමාවී උතුරු ඇමරිකාවට වසන්තය උදා වී ඇත. සියල්ලෝම ක්‍රියාශීලීව එදිනෙදා කටයුතුවල නියැලෙති. වසන්තය ඔවුනට ආශිර්වාදයකි. කුරුල්ලන් නැරඹීමට රුචියක් දක්වන්නෝ, තම දුරදක්න ද උපදෙස් පොත් ද අතැතිව තම ප්‍රියතම කුරුලු විශේෂ පිළිගැනීමට මග බලා සිටිති. එහෙත් ඔවුන් ගේ බලාපොරොත්තු සුන් වන ලකුණු දැන් පහළ වෙමින් තිබේ. ඊට හේතුව, වාර්තා වන අන්දමට, පසුගිය වසර **30** ක කාලය පුරා එරටට පැමිණෙන සංචාරක කුරුලු ගහණය **50%** කින් පමණ පහත වැටී තිබීමය.



4



6



3



1

### 1 - Andean Flamingo

පේරු, ආජෙන්ටිනාව, බොලිවියාව, චිලී වැනි රටවල් ආශ්‍රිතව ජීවත් වන කුරුලු විශේෂයකි.

දේශගුණික විපර්යාස හේතුවෙන් නොකඩවා පවතින නියගය, ඔවුන් ජීවත්-වන ලවණ සාන්ද්‍රණය අධික වැව් සිඳීයාමට හේතුවීමත්, කැණීම් කටයුතු නිසාත්, වාසස්ථාන අහිමිවීමේ දරුණු අභියෝගයට මුහුණ පා සිටී.

බිත්තර එකතු කරන්නන් කුරුලු කැදලි සහිත ජනපද ආක්‍රමණය කිරීම ද මෙම කුරුලු ගහණය වඳවීමේ තර්ජනයට මුහුණ පෑමට හේතු වී තිබේ.

### 2 - Eastern Meadowlark

මොවුන් කැදලි තනන තෘණබිම් හා පුරන් කුඹුරු වගා කටයුතු සඳහා යොදා ගැනීම කුරුලු ගහණය අඩුවීමට හේතු වී තිබේ.

ඊසාන දිග ඇමරිකා එක්සත් ජනපදයේ විනාන්තර නැවත සිටුවීමේ ව්‍යාපෘතිය හේතුවෙන් ද ඔවුනට හිමි විවෘත භූමි ප්‍රදේශ අහිමි වෙමින් පවතී

### 3 - Cerulean Warbler

මෙම කුරුලු විශේෂයේ හදවත බඳු වාසභූමිය වූ මධ්‍යම Appalachians හී ගල් අඟුරු කැණීම් කටයුතු හේතුවෙන්, ඔවුනට වාසස්ථාන අහිමි වෙමින් පවතී. එමගින් සිදුවන වන විනාශයත් සමග කැදලි විනාශ වීමෙන් කුරුලු ගහණය වඳ-වීමේ තර්ජනයට මුහුණ පා සිටී.

### 4 - Pied Flycatcher

කාලගුණ විපර්යාසයත් සමග, ආහාර හිඟවීම හේතුවෙන් අවදානමට මුහුණ පා සිටින කුරුලු විශේෂයකි. විශේෂයෙන්ම නෙදර්ලන්තය වැනි රටවල බහුලව කැදලි තනා සිටින මොවුන්, සිය පැටවු පෝෂණය සඳහා දළඹුවන් හිඟවීමේ ගැටලුවට මුහුණ පා සිටී.

### 5 - Bobolink

නෙත් බිම් ආශ්‍රිතව ආහාර සොයා ගැවසෙන මෙම කුරුලු විශේෂය ද නෙත් බිම් අහිමි වීමේ ගැටලුවෙන් පීඩා විඳී. මොවුන් කැදලි තනන උස්ව වැඩුණු තෘණ භූමි වගා කටයුතු සඳහා සංවර්ධ-නය කිරීම නිසා වාසස්ථාන අහිමි වීමේ ගැටලුව ද කුරුලු ගහණය අඩු වීමට හේතු වී තිබේ.

### 6 - Lesser Yellowlegs

පෘථිවි තලය උණුසුම් වීමේ හේතුවෙන් වර්ෂා රටාව වෙනස් වීම නිසා මෙම කුරුල්ලන් අභිජ-නනය සඳහා යොදා ගන්නා තෙත්බිම් අහිමි වෙමින් පවතී. ඇතැම් ප්‍රදේශවල කුරුලු ගහණය සීඝ්‍රයෙන් පහත වැටීම මෙහි ප්‍රතිඵලයකි.

ටයිම් ඇසුරෙනි

ලලනි